ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2014 අගෝස්තු 21 වැනි දින |

## 2014 ජුනි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

වෙළෙඳ හිඟයේ සැලකිය යුතු අඩුවීමත් සමඟ 2014 ජුනි මාසයේ දී විදේශීය අංශය තවදුරටත් ශක්තිමත් විය. අපනයන ආදායම අඛණ්ඩව වර්ධනය වූ අතර, ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් ආනයනයේ සිදු වූ අඩු වීම හේතුවෙන් ආනයන වියදම තවදුරටත් අඩු විය. ජංගම ගිණුමේ හිඟය තවදුරටත් අඩු කිරීමට දායක වෙමින් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් සහ සංචාරක ඉපැයීම් ද මාසය තුළ දී ඉහළ ගියේය. මෙම වර්ධනයන් සහ මූල්‍ය ගිණුම වෙත වූ අඛණ්ඩ ලැබීම්, 2014 වසරේ ජුනි මස අග වනවිට ගෙවුම් තුලනයේ සැලකිය යුතු මට්ටමක අතිරික්තයක් සඳහා හේතු විය.

**ගෙවුම් තුලනයේ වෙළෙඳ ගිණුම**

2014 වසරේ පළමු භාගය තුළ දී සමුච්චිත වෙළෙඳ හිඟය සියයට 20.1 කින් අඩු වූ අතර, මේ සඳහා අපනයන ආදායමේ සියයට 16.8 ක වර්ධනය සහ ආනයන වියදමේ සියයට 1.2 ක අඩුවීම හේතු විය. 2014 ජුනි මාසයේ දී අපනයන ආදායම පසුගිය වසර හා සැසඳීමේ දී, එ.ජ. ඩොලර් මිලියන 986 ක් දක්වා සියයට 22.0 කින් වර්ධනය වූ අතර, ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,439 ක් දක්වා සියයට 4.6 කින් අඩු විය. ඒ අනුව, 2014 ජුනි මාසයේ දී වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 454 ක් දක්වා සියයට 35.3 කින් අඛණ්ඩව නවවෙනි මසටත් අඩු විය.

**අපනයන ක්‍රියාකාරිත්වය**

ප්‍රධාන කාණ්ඩයන් සියල්ලකම අපනයන පුළුල් වීම, 2014 ජුනි මාසයේ අපනයන වර්ධනය සඳහා දායක විය. අපනයන ආදායමට ප්‍රධානතම දායකත්වය සපයන කාර්මික අපනයන (සියයට 64 ක දායකත්වයක්) සමස්ත අපනයන වර්ධනය සඳහා පුරෝගාමී වූ අතර, අනතුරුව කෘෂිකාර්මික අපනයන (සියයට 36 ක දායකත්වයක්) ඒ සඳහා හේතු විය.

පසුගිය වසරට සාපේක්ෂව කාර්මික අපනයන ආදායම 2014 ජුනි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 725 ක් දක්වා සියයට 18.7 කින් වර්ධනය වූ අතර, මේ සඳහා රෙදිපිළි හා ඇඟළුම්, රබර් නිෂ්පාදිත සහ සම් නිෂ්පාදිත වැනි අපනයන කාණ්ඩයන්ගේ හිතකර ක්‍රියාකාරිත්වය ප්‍රධාන වශයෙන් හේතු විය. මුළු අපනයනයන්ගෙන් සියයට 45.3 ක් වන රෙදිපිළි හා ඇඟළුම් අපනයනය 2014 ජුනි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 446 ක් දක්වා පසුගිය වසරට සාපේක්ෂව සියයට 25 කින් වර්ධනය වූ අතර, එය අපනයන ආදායමේ සමස්ත වර්ධනය සඳහා සියයට 50 කට වැඩි දායකත්වයක් සැපයීය. පිළිවෙළින් සියයට 34.6 කින් හා සියයට 12.1 කින් වර්ධනය වූ යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන සාම්ප්‍රදායික ඇඟළුම් වෙළෙඳපොළවල් වෙත වූ ඇඟළුම් අපනයන මෙන්ම, සියයට 44.5 කින් වර්ධනය වූ සාම්ප්‍රදායික නොවන ඇඟළුම් වෙළෙඳපොළවල් වෙත වූ අපනයන යන දෙඅංශයම ඇඟළුම් අපනයනයෙහි වූ ශීඝ්‍ර වර්ධනයට දායක විය. ඇඟළුම් කර්මාන්තයේ මෙම ශීඝ්‍ර වර්ධනය, 2016 වසර සඳහා වූ ඇඟළුම් අපනයන ඉලක්කය වන එ.ජ. ඩොලර් බිලියන 5 ක මට්ටම ඊට ප්‍රථමයෙන් ළඟාකර ගැනීමට මෙම කර්මාන්තයට ඇති හැකියාව පිළිබිඹු කරයි. ඇඟළුම් කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මෙරටදීම නිෂ්පාදනය කිරීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි නව ශ්‍රී ලාංකීය වෙළෙඳ නාම ප්‍රවර්ධනය කිරීම වැනි උපායමාර්ග මෙම කර්මාන්තයේ ශීඝ්‍ර වර්ධනයට උපකාරී විය. ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තය විසින් සේවක ආරක්ෂාව සහ අනෙකුත් තත්ත්වයන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පවත්වා ගෙන යාම තුළින් ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පවතින ප්‍රබල තරගකාරිත්වයට මුහුණ දීමට බොහෝ සෙයින් හැකියාව ලැබී ඇත.

කාර්මික අපනයන සඳහා දෙවන විශාලතම දායකත්වය සපයන රබර් නිෂ්පාදිත අපනයන 2014 ජුනි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 77 ක් දක්වා සියයට 11.1 කින් වර්ධනය වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් රබර් ටයර් අපනයනයේ වර්ධනය හේතු විය. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි අමු ද්‍රව්‍ය ලෙස භාවිතා කරන රබර්වල මිල තවදුරටත් අඩු මට්ටමක පැවතීම රබර් අමුද්‍රව්‍යයක් ලෙස අපනයනය කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපෑව ද මෙම තත්ත්වය දේශීය රබර් නිෂ්පාදිත නිපැයුම්කරුවන්හට වාසිදායක වූ අතර එකතු කළ අගය සහිත රබර් අපනයනය දිරිමත් කරන ලදී. තවද, සම්භාණ්ඩ, ගමනාගමන ආශ්‍රිත සම්භාණ්ඩ අයිතමයන් හා පාවහන් අපනයනය මෙම මාසය තුළ දී දෙගුණයකට වඩා වැඩියෙන් වර්ධනය විය. ආහාර හා පාන, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික

උපකරණ, ප්‍රවාහන උපකරණ සහ රසායනික නිෂ්පාදිත අපනයනය වර්ධනය වීම ද කාර්මික අපනයනයේ වර්ධනයට දායකත්වයක් සැපයීය. 2014 ජුනි මාසයේ දී දියමන්ති හා ස්වර්ණාභරණ අපනයනය අඩු වුව ද මැණික් අපනයනය සැළකිය යුතු ලෙස වර්ධනය විය. ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනය ද අඩු වූ අතර, ඉන්දියාව වැනි කලාපීය තරගකරුවන්ගෙන් ඇතිවන ප්‍රබල තරගකාරිත්වය හේතුවෙන් නැව් හා ගුවන්යානා ඉන්ධන අපනයනය අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

2014 ජුනි මාසයේ දී කෘෂිකාර්මික අපනයන පෙර වසරේ එම මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 256 ක් දක්වා සියයට 33 කින් පමණ වර්ධනය වෙමින් යහපත් ක්‍රියාකාරිත්වයක් වාර්තා කරන ලදී. තේ අපනයන පරිමාව සියයට 23.5 කින් ද තේ අපනයන සාමාන්‍ය මිල සියයට 6.5 කින් ද වර්ධනය වීමේ සමස්ත ප්‍රතිඵලයක් ලෙස 2014 ජුනි මාසයේ දී තේ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 153 ක් දක්වා සියයට 31.5 කින් වර්ධනය විය. පොල් මද නිෂ්පාදිත අපනයන වැඩිවීම හේතුවෙන් පොල් අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 32 ක් දක්වා දෙගුණයකටත් වඩා වැඩියෙන් වර්ධනය විය. පෙර වසරේ පැවති යහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් පොල් නිෂ්පාදනයේ සිදු වූ වැඩිවීම පිළිබිඹු කරමින් 2014 වසරේ පළමු භාගය තුළ දී පොල් මද සහ පොල් මද නොවන නිෂ්පාදිත යන කාණ්ඩ දෙකෙහිම අපනයනයන්හි යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ මුහුදු ආහාරවල ඉහළ අපනයන ආදායම් ද කෘෂිකාර්මික අපනයන ආදායමේ වර්ධනය සඳහා දායක විය. කෙසේ වුවද, 2014 ජුනි මාසයේ දී අමුද්‍රව්‍ය ලෙස වූ රබර් අපනයනය 2013 වසරේ ජුනි මාසයට සාපේක්ෂව සියයට 23.7 කින් අඩු විය. රබර් නිෂ්පාදන කර්මාන්ත සඳහා අමු රබර් භාවිතයට ගැනීම හේතුවෙන් අඛණ්ඩව රබර් අපනයන පරිමාව අඩුවීම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ප්‍රධාන රබර් පාරිභෝගිකයන්ගේ ඉල්ලුම අඩුවීම සහ නව රබර් නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන ඉහළ යාම තුළින් මිල අඩු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

**ආනයන ක්‍රියාකාරිත්වය**


ප්‍රධාන වශයෙන් අන්තර් භාණ්ඩ ආනයන වියදම අඩු වීම හේතුවෙන් 2014 ජුනි මාසයේ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,439 ක් දක්වා සියයට 4.6 කින් අඩු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, 2014 පළමු මාස හය තුළ දී ආනයන වියදම 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1.2 කින් සුළු වශයෙන් අඩු විය.


2014 ජුනි මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 891 ක් දක්වා සියයට 7.5 කින් අඩු වූ අතර, ඛනිජ තෙල්, තිරිඟු හා ඉරිඟු, රත්‍රන් සහ පොහොර ආනයනයේ සිදු වූ සැළකිය යුතු අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන වියදම අඩුවීම සඳහා බොරතෙල් ආනයනයේ සිදු වූ සැලකිය යුතු අඩු වීම හේතු විය. තිරිඟු ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසය

හා සැසඳීමේ දී සියයට 62 කින් අඩු වූ අතර, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි තිරිඟු මිලෙහි සිදු වූ ශීඝ්‍ර අඩුවීම මේ සඳහා හේතු විය. 2014 ජූනි මාසයේ දී දියමන්ති, අගනා ගල් සහ ලෝහ සඳහා වූ ආනයන වියදම ද එ.ජ. ඩොලර් මිලියන 5.6 ක් දක්වා සියයට 88.6 කින් අඩු වූ අතර, රත්‍රන් සහ දියමන්ති ආනයන අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2014 ජූනි මාසයේ දී පොහොර ආනයනය පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 14 ක් දක්වා සියයට 54.5 කින් අඩු විය. රට තුළ පැවති වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පොහොර සඳහා වූ ඉල්ලුම අඩුවීම සහ ස්වාභාවික ඛනිජ වායුවල මිල ගණන් පහත වැටීම හේතුවෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පොහොර මිල ගණන් අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ප්ලාස්ටික් හා උපාංග, ආහාර නිෂ්පාදිත, කඩදාසි හා ඝන කඩදාසි සහ ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම් සළකා බලන ලද කාලය තුළ දී වර්ධනය විය.

මේ අතර, 2014 ජූනි මාසයේ දි පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 277 ක් දක්වා සියයට 1.2 ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී. සීනි හා රසකැවිලි සහ ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත වැනි ආහාර හා පාන කාණ්ඩයට අයත් ආනයනයන්හි වියදම වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. කෙසේ වුවද, කිරි නිෂ්පාදිත, මුහුදු ආහාර සහ තෙල් හා මේද ආනයන වියදම් 2014 ජූනි මාසයේ දී අඩු විය. ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සියයට 7.6 කින් අඩු වූ අතර, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයනය සියයට 27.1 කින් සහ ගෘහ උපකරණ ආනයනය සියයට 31.1 කින් අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, රථ වාහන, ගෘහ හා දැව භාණ්ඩ සහ රෙදිපිළි හා උපාංග ආනයනය 2014 ජූනි මාසයේ දී වර්ධනය විය.

2014 ජූනි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 270 ක් වූ අතර, එය 2013 ජූනි මාසයේ දී වාර්තා කළ මට්ටමට සමාන විය. මෑත කාලයේ දී භාණ්ඩ තොග ගොඩනගා ගැනීම සහ මහා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති බොහොමයක් මේ වනවිට සම්පූර්ණ වී තිබීම හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයන වර්ධනය ඉතා සුළු වශයෙන් සිදු විය. සන්නිවේදන උපකරණ, කාර්යාලීය උපකරණ සහ රෙදිපිළි කර්මාන්තය ආශ්‍රිත යන්ත්‍රසූත්‍ර ආනයනය මෙම කාලපරිච්ඡේදයේ දී අඩු වුව ද ඉංජිනේරු උපකරණ, විද්‍යුත් උපකරණ, විද්‍යුත් මෝටර් රථ සහ උත්පාදක කට්ටල ආනයනයේ වර්ධනය හේතුවෙන් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදම සියයට 5.1 කින් වර්ධනය විය. ප්ලාස්ටික්, රබර් සහ වීදුරු බඩු ආනයනය වර්ධනය හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම සියයට 9.0 කින් වර්ධනය විය. කෙසේ වුවද, ප්‍රවාහන උපකරණ ආනයනය, සියලුම උප කාණ්ඩයන්ගේ අඩුවීමත් සමග සියයට 40.9 කින් අඩු විය.




**ගෙවුම් තුලනයේ සේවා ගිණුම යටතේ වන සංචාරක ඉපැයුම්**

2014 වසරේ ජූලි මාසයේ දී සංචාරක පැමිණීම්, 2013 වසරේ ජූලි මාසයේ දී වාර්තා වූ 107,016 සිට 133,971 දක්වා සියයට 25.2 ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, 2014 ජූලි මාසයේ දී සංචාරක ඉපැයීම් 2013 වසරේ ජූලි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 144 සමඟ සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 193.6 ක් දක්වා සියයට 34.4 කින් ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. සමුච්චිත අගයන් සැලකීමේ දී සංචාරක පැමිණීම් 2014 වසරේ ජූලි මාසය දක්වා සියයට 24.7 කින් වර්ධනය වෙමින් 861,324 ක් වූ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 1,244.4 ක් දක්වා සියයට 33.9 කින් වර්ධනය විය. 2014 වසරේ ජූලි මාසය තුළ සංචාරකයන් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර පහ වශයෙන් ඉන්දියාව, එක්සත් රාජධානිය, චීනය, ප්‍රංශය සහ ජර්මනිය දැක්විය හැකි අතර, මාසය තුළ දී සිදු වූ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 51 කට පමණ මෙම මූලාශ්‍ර දායක විය.

**ගෙවුම් තුලනයේ ජංගම සංක්‍රාම**

විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2014 වසරේ ජූනි මාසයේ දී 2013 වසරේ ජූනි මාසයේ වූ එ.ජ.ඩොලර් මිලියන 528.2 සිට එ.ජ.ඩොලර් මිලියන 585.1 දක්වා සියයට 10.8 කින් ඉහළ ගියේය. ඒ අනුව, 2014 වසරේ ජූනි මාසය දක්වා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණයන්හි සමුච්චිත ලැබීම් 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,039 සිට එ.ජ. ඩොලර් මිලියන 3,360 දක්වා සියයට 10.6 ක වර්ධනයක් වාර්තා කළේය.

**ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම**

2014 වසරේ ජූනි මස අග වනවිට රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 196.5 ක් වූ අතර, එය පිළිවෙළින් එ.ජ.ඩොලර් මිලියන 54.4 ක

භාණ්ඩාගාර බිල්පත් සහ එ.ජ. ඩොලර් මිලියන 142.1 භාණ්ඩාගාර බැඳුම්කර වෙත වූ ශුද්ධ ලැබීම්වලින් සමන්විත විය. මේ අතර, 2014 වසරේ ජූනි මාසය දක්වා දිගු කාලීන ණය ලෙස රජය වෙත වූ ලැබීම් 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 951 සමඟ සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 962 ක් විය. 2014 වසරේ ජූනි මාසය දක්වා කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ විදේශීය ආයෝජන 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 116.5 සමඟ සැසැඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 48 ක සමුච්චිත ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. කෙසේ වුවත්, 2014 වසරේ අගෝස්තු මස 18 දින වනවිට කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 86 ක් විය. තව ද, 2014 වසරේ පළමු මාස හය තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත වූ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 105 ක් විය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2014 වසරේ පළමු භාගය තුළ දී සමස්ත ගෙවුම් තුලනය, 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 169.2 ක හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,953.6 ක හිතකර අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි ඇස්තමේන්තු කර තිබේ.

**ජාත්‍යන්තර සංචිත**

2014 වසරේ ජූනි මාසය අග වනවිට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ආසියානු නිෂ්කාශන සංගමයේ ශේෂයන් සහිතව එ.ජ. ඩොලර් බිලියන 9.2 ක මට්ටමට ළඟා වූ අතර, බැංකු අංශයේ විදේශීය වත්කම් ඇතුළත්ව මුළු විදේශීය වත්කම් එ.ජ. ඩොලර් බිලියන 10.7 ක් විය. ආනයනික මාස වශයෙන් සැලකූ විට 2014 වසරේ ජූනි මස අග වනවිට දළ නිල සංචිත ආනයනික මාස 6.1 කට සමාන වූ අතර, මුළු විදේශීය වත්කම් ආනයනික මාස 7.2 කට සමාන විය. එ.ජ. ඩොලර් මිලියන 740.6 ක විදේශ ණය සේවාකරණ ගෙවීම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම් සඳහා වූ එ.ජ. ඩොලර් මිලියන 351 ක ගෙවීම් පැවතිය ද 2014 වසරේ පළමු භාගය තුළ දී සංචිත ප්‍රමාණවත් මට්ටමක පවත්වා ගැනුණි. ස්ථාවර වර්ධනයක් පැවති දළ නිල සංචිත තවදුරටත් වඩාත් තිරසාර මට්ටමකට ළඟා වීම පිළිබිඹු කරමින් 2014 වසරේ අගෝස්තු මස ආරම්භයේ දී ආසියානු නිෂ්කාශන සංගමයේ ශේෂයන් රහිතව එ.ජ. ඩොලර් බිලියන 9 මට්ටම ඉක්මවා ගියේය.

**විනිමය අනුපාතිකයේ හැසිරීම**

2014 වසරේ මේ දක්වා (2014 අගෝස්තු මස 18 දක්වා) කාලය තුළ දී රුපියල, එ.ජ. ඩොලරයට එරෙහිව ආන්තික වශයෙන් සියයට 0.45 කින් අධිප්‍රමාණය වෙමින් ස්ථාවරව පැවතුණි. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල, යුරෝවලට එරෙහිව සියයට 3.50 කින් ද, කැනේඩියානු ඩොලරයට

එරෙහිව සියයට 2.62 කින් ද, චීන රෙන්මින්බිවලට එරෙහිව සියයට 1.87 කින් ද අධිප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 0.99 කින් ද, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 1.40 කින් ද, සිංගප්පූරු ඩොලරයට එරෙහිව සියයට 1.22 කින් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 3.79 කින් ද අවප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 1. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් - 2014 ජනවාරි - ජූනි (අ)

| | 2013 ජූනි (එ.ජ.ඩො. මිලියන) | 2014 ජූනි (එ.ජ.ඩො. මිලියන) | ජූනි වර්ධනය (සියයට) | 2013 ජන. සිට ජූනි (එ.ජ.ඩො. මිලියන) | 2014 ජන. සිට ජූනි (එ.ජ.ඩො. මිලියන) | ජන. සිට ජූනි වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **807.6** | **985.6** | **22.0** | **4,656.4** | **5,438.9** | **16.8** |
| මෙයින්: | | | | | | |
| කෘෂිකාර්මික | 192.6 | 256.1 | 33.0 | 1,117.3 | 1,356.7 | 21.4 |
| මෙයින්: තේ | 116.0 | 152.6 | 31.5 | 684.2 | 797.0 | 16.5 |
| කාර්මික | 611.1 | 725.3 | 18.7 | 3,521.9 | 4,030.1 | 14.4 |
| මෙයින්: රෙදිපිළි හා ඇඟළුම් | 356.9 | 446.2 | 25.0 | 2,000.8 | 2,412.9 | 20.6 |
| රබර් නිෂ්පාදිත | 69.0 | 76.6 | 11.1 | 397.1 | 436.9 | 10.0 |
| ආහාර පාන හා දුම්කොළ | 17.2 | 22.5 | 30.7 | 103.5 | 144.0 | 39.1 |
| ඛනිජ ද්‍රව්‍ය | 3.1 | 2.9 | -6.0 | 11.5 | 45.2 | 294.1 |
| **ආනයන** | **1,509.4** | **1,439.4** | **-4.6** | **9,094.1** | **8,985.0** | **-1.2** |
| මෙයින්: | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 274.0 | 277.3 | 1.2 | 1,524.5 | 1,599.4 | 4.9 |
| මෙයින්: ආහාර හා පාන වර්ග | 120.8 | 135.6 | 12.3 | 704.6 | 719.9 | 2.2 |
| ආහාරමය නොවන- පාරිභෝගික භාණ්ඩ | 153.3 | 141.7 | -7.6 | 819.9 | 879.5 | 7.3 |
| අන්තර් භාණ්ඩ | 964.0 | 891.5 | -7.5 | 5,399.4 | 5,558.8 | 3.0 |
| මෙයින්: ඛනිජ තෙල් | 455.2 | 412.4 | -9.4 | 2,219.5 | 2,460.7 | 10.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 156.9 | 164.4 | 4.8 | 965.9 | 1,048.8 | 8.6 |
| ආයෝජන භාණ්ඩ | 269.6 | 269.8 | 0.1 | 2,163.3 | 1,820.7 | -15.8 |
| මෙයින්: යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 138.6 | 145.6 | 5.1 | 1,135.0 | 989.4 | -12.8 |
| ප්‍රවාහන උපකරණ | 37.7 | 22.3 | -40.9 | 327.1 | 218.9 | -33.1 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 92.9 | 101.3 | 9.0 | 698.2 | 610.6 | -12.5 |
| **වෙළෙඳ ශේෂය** | **-701.8** | **-453.8** | **-35.3** | **-4,437.6** | **-3,546.1** | **-20.1** |
| **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** | **528.2(ආ)** | **585.1** | **10.8** | **3,039.0(ආ)** | **3,360.0** | **10.6** |
| **සංචාරක ඉපැයුම්** | **121.5(ආ)** | **149.1** | **22.7** | **785.4(ආ)** | **1,050.9** | **33.8** |
| **විවිධ ආයෝජන (ශුද්ධ)** | **8.9** | **28.8** | | **116.5** | **48.0** | |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ඇ)** | **387.2** | **199.9** | **-48.4** | **2,788.9** | **3,429.5** | **23.0** |
| එයින්: භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 110.9 | 67.0 | -39.6 | 1,818.5 | 941.9 | -48.2 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | | | | | 1,500.0 | |
| දිගුකාලීන ණය | 265.2 | 123.1 | -53.6 | 950.5 | 961.7 | 1.2 |
| **විදේශීය සෘජු ආයෝජන (ඈ)** | | | | **219.0** | **442.3** | **102.0** |

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඈ) එක් එක් කාලපරිච්ඡේදය සඳහා අදාළ දත්ත පළමු කාර්තුව සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ විදේශීය ණය ද ඇතුළත් කොට ඇත.